# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2054/51 - 2018 ජනවාරි මස 19 වැනි සිකුරාදා - 2018.01.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

07 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන)පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර-

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 233, බටුවංගල ග්‍රාම නිලධාරි වසමේ, බටුවංගල ගමේ පිහිටි අ.ග.පි. 472 දරන අවසාන පිඹුරේ (අතිරේක අංක 21) ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.8330 ක් වන පහත සඳහන් ඉඩම.

01. **කැබලි අංකය** 770

ඉඩමේ නම: කුරුදුවත්ත; විස්තරය : ගෙවතු හා ලඳු කැළෑ ; ප්‍රමාණය: හෙක්ටයාර් 2.8330.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 මැයි මස 16 වැනි දින පෙ.ව. 10.00 ට නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 මැයි මස 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. බී. කේ. ජානක ගුරුසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නෙළුව.

2018 ජනවාරි මස 11 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-191


1A - G 26967 - 27 - (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*